For Online Class details WhatsApp 071-9020298

# 3 ශ්‍රේණිය සිංහල ගුරු අත් පොතට වැඩ පොත - අංක 01

## L 1, S 1 නිපුණතා ආවරණය - 2021



- අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන් දෙයි.
    1. පවසන දෙයකට සවන් දීම.
    2. කතන්දරවලට සවන් දීම.
    3. ළමා ගීතවලට සවන් දීම.
    4. ළමා කවිවලට සවන් දීම.
- අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි.
    1. නිදහසේ කතන්දර පැවසීම.
    2. මාතෘකාවකට අදාළ ව කතා කිරීම.

සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

# 3 ශ්‍රේණිය මව්බස (සිංහල)

# $L_1 S_1$ ඉගෙනුම් පල

- පවසන ලද උපදෙස් අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- කතන්දරවලට සවන් දී අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.
- ළමා ගීතවලට සවන් දෙමින් තාල තබයි.
- ළමා කවි කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- සිද්ධි ගළපමින් කතන්දරයක් ඉදිරිපත් කරයි.
- මාතෘකාවකට අදාළ ව පැහැදිලි ව අදහස් ප්‍රකාශ කරයි.

## පවසන දෙයකට සවන් දීම

01. පහත සඳහන් උපදෙස්වලට සවන් දී අනුව ක්‍රියාකාරකමෙහි නිරත වෙන්න.

1. දී ඇති කොටුව මැද ගෙයක් අඳින්න.
2. ගෙදරට යන පාර අඳින්න.
3. පාර අයිනේ ගසක් අඳින්න.
4. ඈතින් පෙනෙන කඳු වැටියක් අඳින්න.
5. කඳු වැටිය අතරින් පායා එන ඉර අඳින්න.
6. පියාඹා යන කුරුල්ලන් කිහිප දෙනෙකු අඳින්න.
7. අඳින ලද චිත්‍රය ලස්සනට පාට කරන්න.

# කතන්දරවලට සවන් දීම

02. පහත සඳහන් කතන්දරයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

එක්තරා ගමක ධනවත් මිනිසකු සිටියා. ඔහු වයස්ගත නිසා තමාගේ දේපළ පුතුන් දෙදෙනාට දීමට අදහස් කළා. පුතුන්ට දේපළ දුන්නට මේ දෙන්නා ඒවා රැක ගන්නත් දක්ෂ වෙන්න ඕනෑ. එහෙම හිතලා තම අදහස බිරියටත් කිවුවා. තාත්තා පුතුන් දෙදෙනා ම තමා ළඟට කැඳෙවුවා. ''අපේ ගෙදර එක සමාන ව හදල තිබෙන කාමර දෙක මම පුතාල දෙන්නට දෙනවා. ඒ කාමර දෙක දවස් තුනක දී අඩු වියදමක් යොදවලා උත්සාහවන්තයා සහ නුවණක්කාරයා මොනවා හරි දෙයකින් පුරවන්න ඕනෑ. ඒ වෙනුවෙන් මම සුළු මුදලක් දෙනවා'' තාත්තා පුතාලා දෙන්නට කිවුවා.

මේ පුත්තු දෙන්නා තාත්තාටත්, අම්මාටත් හරි ම කීකරු යි. ඒ නිසා තාත්තා පැවරූ දෙය කරන්න කැමති වුණා. ලොකු පුතා පසුදින උදෑසන ම වැඩ කරන්න පටන් ගත්තා. පිදුරු තිබෙන තැනක් සොයා ගත්තා. පිදුරු මිටි කරත්තයකට පුරවලා පිදුරු ගෙනත් කාමරයට දැම්මා. දින තුන සම්පූර්ණ වන දවසේ කාමරය පිදුරුවලින් පුරවන්න ලොකු පුතාට හැකි වුණා. තාත්තා පුතුන් දෙන්නාගේ වැඩ ගැන සෝදිසියෙන් සිටියා. ලොකු පුතා වෙහෙස මහන්සි වී උත්සාහයෙන් වැඩ කරන ආකාරය දැක්කා.

දින තුන සම්පූර්ණ වූ විට තාත්තා පුතුන් දෙන්නා හමු වුණා. ලොකු පුතාගේ කාමරයට ගියා. ඒ කාමරය පිදුරුවලින් පුරවලා. ලොකු පුතාගේ උත්සාහය ගැන සතුටු වුණා. පොඩි පුතාගේ කාමරයට ගියා. අඳුර පිරුණු හිස් කාමරයක් විතර යි දුටුවේ. ''මේ හිස් කාමරයක් නේ'' තාත්තා පොඩි පුතා දිහා බලලා කිවුවා. ''මම අඩු මුදලකින් පහනක් ගත්තා. දැන් මේ කාමරය පුරවලා පෙන්වන්නම්.'' පොඩි පුතා හිනා වෙවී කිවුවා. කාමරය මැද පහන තබලා එය දැල්වුවා. අඳුරු කාමරය ආලෝකයෙන් පිරුණා.

''ලොකු පුතා උතස්හවනත්යා. පොඩි පුතා නුවණකක්රයා. දෙනන් ම එක වගේ දක්ෂ යි. මගේ දේපළ ඔක්කෝම පුතාලා දෙන්නට දෙනවා.'' කියලා තාත්තා පුතාලා දෙන්නා සතුටින් වැලඳ ගත්තා. තම පුතුන් දෙන්නගේ දක්ෂකම දැකලා අම්මගේ ඇස්වලත් සතුටු කඳුළු පිරුණා.

1. කතාවේ සඳහන් තාත්තාට පුතුන් කී දෙනෙකු සිටියා ද ?

.................................................................................................................................................

2. පිදුරුවලින් කාමරය පිරවූයේ කවරෙක් ද ?

.................................................................................................................................................

3. පොඩි පුතා කාමරය පිරවීමට කළේ කුමක්ද ?

.................................................................................................................................................

4. අම්මගේ ඇස්වල සතුටු කඳුළු පිරුණේ ඇයි ?

.................................................................................................................................................

5. වාක්‍යය හරි නම් කොළ පාට හරියක්ද වාක්‍යය වැරදි නම් රතු පාට හරියක්ද යොදන්න.

1. එක සමාන ව සැදූ කාමර දෙකක් ගෙදර තිබුණා. ( )
2. පුත්තු දෙන්නා දෙමවුපියන්ට අකීකරු යි. ( )
3. පොඩි පුතා වැඩි මුදලකින් පහනක් ගත්තා. ( )
4. තාත්තා පුතුන් දෙන්නාගේ වැඩ ගැන සෝදිසියෙන් සිටියා. ( )
5. ලොකු පුතා වෙහෙස මහන්සි වී උත්සාහයෙන් වැඩ කරා. ( )

## ළමා ගීතවලට සවන් දීම

**03**. පහත සඳහන් ගීතයට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

(කවුරුද කවුරුද දැන් ලොක්කෝ
අපිමයි අපිමයි දැන් ලොක්කෝ...//)
හූ හූ හූ හූ...//
ඔක්කොම අපි ලොක්කෝ

(හතුරු බලේ ගියා කැලේ
අපේ බලේ සමගි බලේ...//)

(ලොක්කො අපි ලොක්කො අපි අද ගමට
ලොක්කො අපි ලොක්කො අපි හෙට රටට...//)
(පුංචි උනත් හරිම සැරයි ගම්මිරිස් ඇටේ
හූස් හූස් ගෑවා නේද ගම්මිරිස් ඇටේ...//)

(කවුරුද කවුරුද දැන් ලොක්කෝ
අපිමයි අපිමයි දැන් ලොක්කෝ...//)
හූ හූ හූ හූ...//

කූඹි ගුලේ තියන බලේ
දිමි ගොට්ටේ තියන බලේ
පුංචි අපේ ලොකුම බලේ
සමගි බලේ සමගි බලේ...

(කවුරුද කවුරුද දැන් ලොක්කෝ
අපිමයි අපිමයි දැන් ලොක්කෝ...//)
හූ හූ හූ හූ...//
ඔක්කොම අපි ලොක්කෝ

(හතුරු බලේ ගියා කැලේ
අපේ බලේ සමගි බලේ...//)

(හඳයා චිත්‍රපටය 1979)

1. පුංචි අපේ ලොකුම බලේ කුමක් ද ?

..........................................................................................................................................

2. එවැනි බලයක් ඇති වෙනත් තැන් දෙකක් ගීතයෙන් සොයා ලියන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

3. පුංචි වුණත් හරිම සැර මොනවා ද ?

..........................................................................................................................................

4. මෙය කුමන චිත්‍රපටයකට ගැයූ ගීයක් ද ?

..........................................................................................................................................

<u>ළමා කවිවලට සවන් දීම</u>

04. පහත සඳහන් කවි පෙළට සවන් දී අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

හැදෙමු අපිත් මේ වාගේ

ඉර පායන තෙක් නිදනා
අයගේ වැඩ පමා වෙනා
අරුණට පළමු ව එයිනා
පිබිදෙනු මැන සැම දිනා

අලුයම දත් නොමැද යෙහෙන
මුව සෝදා නොගෙන එමෙන
අනිකෙකු ඉදිරියට මුහුණ
ගෙන නොදොඩනු මැන කිසිදින

කෑම කමින් චව් චව් යන
සද්ද නගා නොවිකනු මැන
කැඳ ආදිය බොන කල දූන
නොකරනු හඬ සුරු සුරු යන

ඉඳුල් අතින් පැන් බඳුන ද
නාල්ලනුව හැඳි ආදි ද
කටේ කැම පුරවා ඉඳ
නොදොඩන් කිසි විටක සබඳ

මව් පිය ගුරුවරයන් හට
කීකරු විය යුතු සැම විට
ඔවුන් කියන යම් දේකට
නොවෙන් අකීකරු කිසි විට

අසල් ගෙවල්වල නිවසන
ළමයින් සමගින් කිසිදින
සණ්ඩු දබර නොකරනු මැන
සමගිකමින් නිවසනු මැන

තැන් තැන්වල මුලු මුලුවල
එකතු කරනු එපා කසළ
මකුළු දූල් ද වෙනත් කසළ
සුද්ද කරනු ලෙසින් නිමල

තබා තිබෙන පිළිවෙළිනා
කිසියම් බඩුවක් සොබනා
අහකට ගත්තොත් එයිනා
නැවත තබනු තුබු ලෙසිනා

මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ
බාලෝපදේශය පොතෙන් උපුටා ගන්නා ලදී.

1. කවියේ සඳහන් අවවාද තුනක් ලියන්න.

..................................................................................................................................................

..................................................................................................................................................

..................................................................................................................................................

2. කවිය උපුටා ගත් ග්‍රන්ථය සහ එහි කතුවරයා නම් කරන්න.

..................................................................................................................................................

## නිදහසේ කතන්දර කීම

**05.** පහත සිද්ධියෙන් පටන් ගෙන කුඩා කතන්දරයක් ගොඩ නඟන්න.

- සුන්දර දිය ඇල්ලක් කඩා හැලෙමින් තිබුණේ ය කෙළිකවට සිනා හඬ අවට පැතිරුණේ ය. එක වර ම ළමයකු කෑ ගසන හඬක් ඇසුණේ ය. පිරිස කලබලයට පත් වී එදෙසට දිව්වෝය.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

## මාතෘකාවකට අදාළ ව කතා කිරීම

**06.** පහත එක් මාතෘකාවක් තෝරාගෙන මාතෘකාවට අදාළ ව කතාවක් කරන්න. එක් මාතෘකාවක් තෝරාගෙන වාක්‍ය තුනක් ලියන්න.

- ලේනා.
- මොනරා.
- ගිරවා.
- අලියා.
- මගේ ගුරුතුමා/ගුරුතුමිය.
- මගේ යහළුවා.

..........................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................